# ලංකා විදුලිබල මණ්ඩලය
# උතුරුමැද පළාත සඳහා
# <u>භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරිම- 2021</u>

2021 වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ උතුරුමැද පළාත සඳහාඅයත් භාණ්ඩ හා සේවා සැපයිම වෙනුවෙන් අලුතින්ලියාපදිංචිවිමට කැමතිපිළිගත් භාණ්ඩ නිපදවන්නන්, බෙදාහරින්නන්, නියෝජිතයින්, සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන්හා සේවාසපයන්නන්ගෙන්අයදුම්පත්කැඳවනු ලැබේ.

**අයිතම් වර්ගය**

**01. භාණ්ඩ සැපයිම**

| <u>සංකේතය</u> | <u>භාණ්ඩ වර්ගය</u> |
|---|---|
| **M-1** | MCCB, MCB, ELCB, RCCB, කටවුට්ස්, පුලුසු පුරුක්, HRC පුලුසු, පුලුසු රඳවන, නියුට්‍රල් පුරුක්, තඹ බැර යටි, තඹ කෙවුන්, තෙරපි බහන්, කෙවුන් දෙලෝහ හා Exothermic Welding සඳහා අවශ්‍ය ද්‍රව්‍ය. |
| **M-2** | විදුලි උපකරණ, හැලජන් ලාම්පු ගැලපි, විටී ලාම්පු හා ගැලපි,ප්‍රධාන වහරු හා අනෙකුත් විදුලි උපාංග. |
| **M-3** | විදුලි ආරක්ෂිත උපකරණ, ආරක්ෂිත ඇඳුම් පැළඳුම්, ආවුද, මැනිම් උපකරණ, ඉනිමං යනාදිය. |
| **M-4** | සියලුම වර්ගයේ තඹ හා ඇලුමිනියම් වෙනුල තත්, තඹ හා ඇලුමිනියම් පිරියවන, බැඳුම් තත් යනාදිය. |
| **M-5** | යකඩ මනුරු පෙට්ටි |
| **M-6** | පරිගණක, පරිගණක උපාංග, පරිගණක ජාල හා ප්‍රින්ටර් යනාදිය. |
| **M-7** | තැනිම් උපකරණ හා Loose Tools. |

**02. සේවා සැපයිම**

| <u>සංකේතය</u> | <u>සේවා වර්ගය</u> |
|---|---|
| **S-1** | ආරක්ෂක සේවා සැපයිම. |
| **S-2** | සනිපාරක්ෂක සේවා සැපයිම |
| **S-3** | මුද්‍රණ කටයුතු හා පරිගණකලිපි ද්‍රව්‍ය සැපයිම. |
| **S-4** | ලි කණු, වැරකැවු සහ පෙරසවි කොන්ක්‍රිට් කණු, ට්‍රාන්ස්ෆෝමර්ස් සහ අනෙකුත් භාණ්ඩ ප්‍රවාහනය. |
| **S-5** | සිවිල් වැඩ කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවන්. |

**03.** වැරකැවු  කොන්ක්‍රිට් කණු හා පෙරසවි කොන්ක්‍රිට් කණු සපයා ප්‍රවාහනය කර දිම.

**04.** සේවා සැපයුම් ලබාදිම.

**05.** අධිසැර හා අඩුසැර විදුලි මාර්ග සහ උපපොල තැනිම් කටයුතු.

**06.** අධිසැර හා අඩුසැර විදුලි මාර්ග සහ උපපොල නඩත්තු හා පුනරුත්ථාපන කටයුතු.

**07.** අධිසැර හා අඩුසැර විදුලි මාර්ග සහ උපපොලවල මංවර හෙලිකිරිම් කටයුතු.

**08.** ගෙවිම් පැහැර හරින පාරිභෝගිකයන්ගේ විදුලි සැපයුම විසන්ධි කිරිම හා නැවත සන්ධි කිරිම් කටයුතු.

**09.** සේවා මනු පෙට්ටි හා සේවා මනු සවි කිරීම/විතැන් කිරීම.

**10.** වරලත් විදුලි ඉංජිනේරුවරුන්ගේ සේවාව උතුරු මැද පළාත සඳහා.

**<u>අයදුම්කරුවන් සඳහා උපදෙස්</u>**

01. 2020වර්ෂය සඳහා භාණ්ඩ හා සේවා සැපයිමට ලියාපදිංචි වූ සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් හට එම භාණ්ඩ හා සේවා සැපයිම සඳහා 2021 වර්ෂය සඳහා ලියාපදිංචි කිරිමේ ලියකියවිලි මිලදී ගැනිමක් අවශ්‍ය නොවේ.2021 වර්ෂය සඳහා ලියාපදිංචි කිරීම සඳහා මේ වන විටත් දන්වා ඇත.
2020 වසර සඳහා ලියාපදිංචි වී ඇති වරලත් විදුලි ඉංජිනේරුවරුන් සඳහා 2021 වර්ෂයට අවශ්‍ය යාවත්කාලීන කරන ලද විස්තර ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

02. 2020 වර්ෂය සඳහා භාණ්ඩ හා සේවා සැපයිමට ලියාපදිංචි වූ සැපයුම්කරුවන් 2021 වර්ෂය සඳහා වෙනත් භාණ්ඩ හා සේවා සැපයිමක් සඳහා ලියාපදිංචි විමට අවශ්‍ය නම් ඔවුන් එයට අදාල 2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිමේ ලියකියවිලි මිලදී ගෙන අයදුම්පත් නිසි පරිදි සකස් කර භාර දිය යුතුය.

03. එක් එක් භාණ්ඩ/සේවා කාණ්ඩය සඳහා ද වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

04. අදාල අයදුම්පත් කට්ටල **2021-02-10**වන දින දක්වා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (උතුරුමැද) කාර්යාලයෙන් (ලිපිනය පහත දක්වා ඇත) සතියේ වැඩ කරන දින වල **පෙ.ව. 09.00 සිට ප.ව. 02.00** දක්වා ලබාගත හැකිය. අදාළ එක් එක් අයදුම්පත සඳහා ආපසු නොගෙවනු ලබනරු**. 500.00** ක වටිනාකමකින් යුතු **"සාමාන්‍යාධිකාරි ලංකා විදුලිබල මණ්ඩලය"**නමට ලියන ලද බැංකු අණකරයක් මගින් හෝ ලංකා විදුලිබල මණ්ඩලය මගින් නිකුත් කරනු ලබන ගෙවීම් වවුචරයක් මගින් ගෙවීම් කළ යුතුය.

05. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (උතුරුමැද) කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් **2021-02-11**වන දින ප.ව. 0300 ට පෙර ලැබෙන පරිදි එවිමට හෝ අතින් ගෙනැවිත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (උතුරුමැද) කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියටබහාලිමට කටයුතු කළ යුතුය. අයදුම්පත සහිත ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරේ **"Registration of Suppliers & Contractors – 2021 සහ අදාල කාර්යය (Category)"** සඳහන් කළ යුතුය.

06. **2021-02-11**වන දින ප.ව. 03.00 න් පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලබන අතර, ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. අයදුම්පත් කට්ටල සහ මේ පිළිබඳ වැඩි විස්තර පහත සඳහන් කාර්යාලයෙන් ලබා ගත හැක.


**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (උතුරු මැද පළාත)**

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (උතුරු මැද පළාත)කාර්යාලය,**

**1වන මහල,**
**ලංකා විදුලිබල මණ්ඩලය,**
**මෛත්‍රීපාල සේනානායක මාවත,**
**අනුරාධපුරය 50000**

**දූ.ක. 025 – 2222552, 025-2235084**
**ෆැක්ස්. 025 - 2222453**